ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

<u>පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන **ඒකාබද්ධ** ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවන හමුව පැවැත්වේ</u>

පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන ඉන්දියා - ශ්‍රී ලංකා ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායමේ දෙවන හමුව 2025 සැප්තැම්බර් 23 වන දින අතථ්‍ය ආකාරයෙන් පැවැත්විණ. ඉන්දීය දූත පිරිස නව සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් ශ්‍රී සන්තෝෂ් කුමාර් සරංගි මහතාගේ ප්‍රධානත්වයෙන් ද ශ්‍රී ලංකා දූත පිරිස බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කේ. ටී. එම්. උදයංග හේමපාල මහතාගේ ප්‍රධානත්වයෙන් මේ සඳහා සහභාගී වූහ.

2. දෙපාර්ශ්වය සූර්ය බලය, සුළං සහ හරිත හයිඩ්‍රජන් වැනි නව තාක්ෂණයන් ඇතුළු පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ වර්ධනයන් පිළිබඳව එකිනෙකා දැනුවත් කළහ. "එක් ඉරක්, එක් ලොවක්, එක් පද්ධතියක්"යන සංකල්පය සඳහා පවතින හැකියාව අවධාරණය කරන ලදී.

3. දෙපාර්ශ්වයම දැරිය හැකි සහ තිරසාර බලශක්තිය වෙත අවධානය යොමු කරමින් ද්විපාර්ශ්වික බලශක්ති සබඳතා ශක්තිමත් කිරීම සඳහා වන කැපවීම යළිත් අවධාරණය කළහ. ඒකාබද්ධ ක්‍රියාකාරී කණ්ඩායම පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය තුළ ප්‍රතිපත්ති මට්ටමේ සාකච්ඡා, ව්‍යාපෘති සංවර්ධනය සහ දැනුම හුවමාරු කරගැනීම සඳහා වේදිකාවක් ලෙස තවදුරටත් කටයුතු කරනු ඇත.

****

**කොළඹ**
***2025* සැප්තැම්බර් *25***